**කොළඹ මහා නගර සභාව**

# පුරප්පාඩු දැන්වීම

## කොළඹ මහා නගර සභාවේ ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව සඳහා

## සහන පදනම මත ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ සේවය ලබා ගැනීම සඳහා

කොළඹ මහා නගර සභාවේ ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ ආයුර්වේද බෙහෙත් ශාලාවල සේවය සඳහා ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් 10 දෙනෙකුගේ සේවය සහන පදනම මත ලබා ගැනීම සඳහා අවම වශයෙන් වසර 03ක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වල ඡායා පිටපත්ද සමඟ **2026.02.09** දින හෝ එදිනට පෙර නාගරික කොමසාරිස්, කොළඹ මහා නගර සභාව, පුරහල, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි **" සහන ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ සේවය ලබා ගැනීම "** යනුවෙන් සඳහන් කළ යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුවේ.

| | | |
|---|---|---|
| 01. | **තනතුර** | : ආයුර්වේද වෛද්‍ය නිලධාරි (සහන පදනම මත සේවය ලබා ගැනීම) |
| 02. | **දීමනාව** | : සේවය කරන දිනකට රු:3,500/-බැගින් මසකට දින 15ක් සඳහා රු: 52,500/-<br>(සේවා අවශ්‍යතාවය මත සති අන්ත සෙනසුරාදා දිනද සේවය කිරීමට සිදුවිය හැක) |
| 03. | කායික සුදුසුකම් | : තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. |
| 04. | **වයස** | : වයස අවුරුදු 25ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. |
| 05. | **අධ්‍යාපන සුදුසුකම්** | : i) පිළිගත් විශ්ව විද්‍යාලයක ආයුර්වේද, සිද්ධ හෝ යුනානි වෛද්‍ය විද්‍යාව පිළිබඳ 05 අවුරුදු පාඨමාලාව හදාරා ලබා ගත් උපාධියක් තිබිය යුතුවීම<br>ii) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුවීම |
| 06. | **වෙනත් සුදුසුකම්** | : ආයුර්වේද වෛද්‍ය විද්‍යාවට අදාළ ඩිප්ලෝමා පාඨමාලා හදාරා තිබීම<br>උපාධිය ලබා ගැනීමෙන් පසු එක් අවුරුදු සීමාවාසික පුහුණුව ලබා තිබීම |
| 07. | **සේවයේ යොදවා ගැනීමේ ක්‍රමය** | : ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව සේවය ලබා ගනු ලැබේ.<br>* සුදුසුකම් ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකින් පසු සේවය ලබා ගැනීම සිදුකෙරේ.<br>* සේවා අවශ්‍යතාවය මත සේවය සඳහා කැඳවීම් කරනු ලැබේ.<br>* විධිමත් ගිවිසුමකට කොළඹ මහා නගර සභාව සමඟ එළැඹිය යුතුය.<br>* රාජකාරි කටයුතු සාර්ථකව කරන්නේද යන්න සොයා බලන අතර, මුල් මාස 06 තුළ අධීක්ෂණය කර සාර්ථකත්වය පිළිබඳ විමසා ඒ සම්බන්ධව තීරණයක් ගනු ලැබේ. |

සේවයේ යොදවා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය නාගරික කොමසාරිස් සතුවේ.

**පාලිත නානායක්කාර**

**නාගරික කොමසාරිස්**

කොළඹ මහා නගර සභාව , පුරහල, කොළඹ 07

2026.01.20